# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2198/12 - 2020 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා - 2020.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට තල්දෙන මීගහකිවුල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ පෙණකැටියාව ජල පිරිපහදු ඒකකය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 14 වැනි දින,
යොමු අංකය : 5/3/BD/01,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 23ඒ ඒ පුස්සැල්ලාව ග්‍රාම නිලධාරී වසමේ පෙණකැටියාව ගමේ පිහිටි මේ සමග එවන දළ සැලැස්මේ දැක්වෙන ගල්වලගාව තැන්න ඉඩම නමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එස්. අයි. රසික් මහතාගේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | බදුල්ල මහියංගන මාර්ගය ; |
| *දකුණට* | : | ඒ. කේ. එගොඩවෙල මහතාගේ ඉඩම ; |
| *බටහිරට* | : | ඒ. කේ. එගොඩවෙල මහතාගේ ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. ඩී. එම්. ඩබ්. දිසානායක මයා,
නො 47, කළුගල්පිටිය,
බදුල්ල.

11 - 32


1A - G 33124 — 58 (2020/10)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට ජා-ඇල ඒකල අපජල බැහැර කිරීමේ ව්‍යාපෘති අදියර 2 යටතේ ඉදිව්ටිය අංක 10 පොම්පාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 14 වැනි දින,
යොමු අංකය : 5/3/GQ/06,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 190/E, ඉදිව්ටිය ග්‍රාම නිලධාරී වසමේ ඉදිව්ටිය ගමේ පිහිටි මේ සමග එවන දල සැලැස්මේ පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් පර්චස් 15ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : හෙට්ටිගම පාර ;
*දකුණට* : ඇල මාර්ගය ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. ජී. ඊ. එෆ්. සී. ප්‍රනාන්දු,
අංක 220/ඒ, තුඩැල්ල,
ජා-ඇල.

11 - 33

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට හල්ලොලුව බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් 02ක් අවශ්‍යව ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 14 වැනි දින,
යොමු අංකය : 5-2/KE/24,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

## උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 108/A හල්ලොලුව ග්‍රාම නිලධාරී වසමේ එරබුදුවල ගමේ පිහිටි දවටගහයට කුඹුර, කොස්ගහයට කනටි සහ මැදකන්ද නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 7.65ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

කැබලි අංක - 01

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1649 දරන පිඹුරේ කැබලි අංක 8හි ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ඇල මාර්ගය ; |
| *දකුණට* | : | ඇල මාර්ගය ; |
| *බටහිරට* | : | අංක 1649 දරන පිඹුරේ කැබලි අංක 8හි ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : එච්. එස්. එස්. එස්. හේවගේ මහතා,
B/22, බෝගල පාර,
එරබුදුවල, කන්නන්තොට.

කැබලි අංක - 02

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන මාර්ගය (බෝගල - මත්තමගොඩ) ; |
| *දකුණට* | : | ප්‍රධාන මාර්ගය හා අංක 826 දරන පිඹුරේ කැබලි අංක 2A හි ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | අංක 1649 දරන පිඹුරේ කැබලි අංක 8හි ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : හේවාලයාගේ ධර්මප්‍රිය ගුණරත්න මහතා,
B/14,
එරබුදුවල, කන්නන්තොට.

11 - 34

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.